# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2250/27 - 2021 ඔක්තෝබර් 21 වැනි බ්‍රහස්පතින්දා - 2021.10.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## හිමිකම් ලියාපදිංචි කිරීම

### සංශෝධන

**1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත**

(14 වන වගන්තිය)

උක්ත ශීර්ෂය යටතේ 2021 මාර්තු මස 29 වන දින අංක 2221/19 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 557 - රාවතාවත්ත නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ කටුබැද්ද නමැති ගමේ පිහිටියා වූ ද, අංක 520205 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 15 හි කැබලි අංක 09 දරන ඉඩම් කොටස සම්බන්ධයෙන් එහි උපලේඛනයෙහි;

''විනිශ්වයන් සහ ඉන්ජෙන්ෂන් තහනම් අපේක්ෂාවෙන් ඇති උකස් සහ බැඳීම් පිළිබඳ විස්තර''යන තීරුවට

1. මොරටුව නගර සභාව විසින් මිලදී ගෙන තිබෙන ඉහත ඉඩම (අක්කර 6) ට යාබද පිහිටි ඉඩමේ අක්කර දෙකක් ද සමග එකී ඉඩම හා පරිශ්‍රය උද්‍යානයක් හෝ විනෝද පිට්ටනියක් ලෙස සදාකාලිකව මොරටුව මහජනයාගේ ප්‍රයෝජනය සඳහා ඉහත සභාව විසින් විවෘක කළ යුතුය.
2. ඉහත කී ඇල්බට් හිල්ඩෙබ්‍රෑන්ඩ් තියෝදෝර් ද සොයිසා වන මා හට මගේ වියදමින් අනුස්මරණ ඵලකයක් ඉදිකිරීමට සහ භූමියේ පහසුකම්වලට බාධා නොවන පරිදි ගලක් මත උද්‍යානයේ නම, භූමියේ නම සහ ගැලපෙන පරිදි වෙනත් ඕනෑම විස්තරයක් හෝ සංඛ්‍යා ලේඛන ඇතුළත් වූ සඳහන් කිරීමක් සකස් කිරීමට අවසර දෙනු ලැබිය යුතුය. එමෙන්ම ඉහත සභාවට එම භූමිය ලබා දෙන අතර එකී සභාව විසින් එහි වියදමින් අනුස්මරණ ඵලකය හෝ ගල් ස්මාරකය හෝ ව්‍යුහය නිසි පිළිවෙලින් හා තත්වයෙන් පවත්වා නඩත්තු කළ යුතුය.
3. එකී උද්‍යානය හෝ විනෝද පිට්ටනිය සෑම විටම ''ද සොයිසා උද්‍යානය '' ලෙස හැඳින්විය යුතුය.
4. ඉහත සභාව විසින් එකී ඉඩම හා පරිශ්‍රය ස්වෙච්ඡාවෙන් අන්සතු නොකළ යුතුය.
5. එමෙන්ම ඉහත සභාව විසින් එහි වියදමින් සෑම විටම එකී උද්‍යානය හෝ විනෝද පිට්ටනිය නිසි පිළිවෙලින් හා තත්වයෙන් මොරටුව මහජනයාගේ ප්‍රයෝජනය උදෙසා පවත්වමින් නඩත්තු කළ යුතුය.

6. ඉහත කී ඇල්බට් හිල්ඩෙබ්‍රෑන්ඩ් තියෝදෝර් ද සොයිසා වන මා විසන් ඉහත මොරටුව නගර සභාව සහ එහි අනුප්‍රාප්තිකයා සමඟ මෙයින් පොරොන්දු වනුයේ සහ ප්‍රකාශ කරනුයේ මෙමඟන් තෑගි කරනු ලබන ඉඩම හා පරිශ්‍රය සියලු ආකාර බැඳීම්වලින් නිදහස් බවත් ඕනෑම පුද්ගලයෙකුට එදිරිව එහි හිමිකම සම්බන්ධයෙන් සෑම විටම වගකියමින් ආරක්ෂා කිරීම මා විසන් සිදු කරන බවත්ය යන්න ඇතුළක් කර සංශෝධනය කරනු ලැබේ.

**පී.එම්.එච්. ප්‍රියදර්ශනී,**
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්

2021 ඔක්තෝබර් මස 12 වැනි දින,
බත්තරමුල්ල
රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර", අංක 1200/6,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

11 - 30

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.